# ශිලාලේඛනවලින් අනාවරණය වන අනුරාධපුර යුගයේ වෛද්‍ය කටයුතු

**පී.එම්.යූ. ප්‍රේමරත්න**[1]

වෛද්‍ය කටයුතු වූ කලී ඕනෑ ම සමාජයක පැවැත්ම සඳහා අවශ්‍ය සාධක අතරින් එකකි. ඒ අනුව අනුරාධපුර යුගයේ පැවති වෛද්‍ය කටයුතු සම්බන්ධයෙන් ශිලාලේඛනවලින් අනාවරණය වන තොරතුරු පිළිබඳ ව මෙහිදී විමර්ශනය කෙරේ. **පර්යේෂණ ගැටලුව** වූයේ අනුරාධපුර යුගයේ වෛද්‍ය කටයුතු සම්බන්ධයෙන් ශිලාලේඛනවලින් හෙළිදරව් වන්නේ කුමනාකාරයේ තොරතුරු ද යන්නයි. ඒ පිළිබඳව සොයාබැලීම ප්‍රධාන ම අරමුණයි. එමෙන් ම අනුරාධපුර යුගයේ වෛද්‍ය කටයුතු පිළිබඳ තොරතුරු හමුවන ශිලාලේඛන මොනවා ද, ඒවායින් හෙළිදරව්වන පරිදි වෛද්‍ය කටයුතු සම්බන්ධ ව සිටි නිලධාරීන් කවුද, මෙකල පැවති සෞඛ්‍ය මධ්‍යස්ථාන සහ ඒවායින් ප්‍රතිකාර ලැබූ පාර්ශව කවුරුන් ද, මේවායේ පරිපාලන කටයුතු සකස්වූයේ කෙසේ ද යන තොරතුරු විමසා බැලීම මෙහි සෙසු **අරමුණු** අතර වේ. **පර්යේෂණ ක්‍රමවේදය** වූයේ මූලාශ්‍රය අධ්‍යයනය යි. විශේෂයෙන් ම ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි අවධානය යොමු වූ අතර ද්විතීයික මූලාශ්‍රය ද පරිශීලනය කෙරිණි. මැදිරිගිරිය ටැම් ලිපිය, මිහින්තලා පුවරු ලිපිය වැනි වෛද්‍ය කටයුතු හා සම්බන්ධ ප්‍රසිද්ධ ශිලාලේඛන හැරුණුවිට තවත් ශිලාලේඛන රාශියකින් මෙම යුගයේ වෛද්‍ය කටයුතු සම්බන්ධ තොරතුරු අනාවරණය කරගත හැකි විය. ඒ අනුව වෛද්‍ය කටයුතු සම්බන්ධ ව සිටි නිලධාරීන් ස්ථර කිහිපයක් යටතේ සකස් වූ බව පෙනේ. ප්‍රධාන වෛද්‍යවරු, සුළු සේවකයන්, බෙහෙත් සකස්කළවුන්, පරිපාලකයන් ශිලාලේඛනයන්හි නොයෙකුත් ආකාරයෙන් හඳුන්වා තිබේ. එමෙන් ම මෙකල පැවති රෝහල්, පැවිදි පාර්ශවයට, ගිහි පැවිදි දෙපාර්ශවයට සහ මුදල් ගෙවා සාමාන්‍ය ජනතාවට වශයෙන් සකස්කර තිබූ බව පෙනේ. එමෙන් ම ආරෝග්‍යශාලා පාලනය සම්බන්ධයෙන් ද ඇතැම් ශිලාලේඛනවලින් තොරතුරු හෙළිකරගත හැකිවිය. මෙහි ලා එළඹි **නිගමන** කිහිපයකි. අනුරාධපුර යුගය වනවිටත් මෙරට වෛද්‍ය කටයුතු සංවිධිත ව පැවතිණ. නිශ්චිත කාර්ය මණ්ඩලයකින් සැදුම් ලද ආරෝග්‍යශාලා පිහිටා තිබූ අතර මෙම වැඩ කටයුතු නිසියාකාර ව සිදුවේදැයි පරීක්ෂා කිරීමට නිලධාරීන් පත්කර තිබිණි. ඔවුන් ද සේවය හරිහැටි නොකළේනම් දඬුවම් පැමිණවූ බව ශිලාලේඛනවලින් නිගමනය කළ හැකි ය. වර්තමානයේ මෙන් ම රජයේ සහ පෞද්ගලික වශයෙන් රෝහල් පැවති බව ඇතැම් රෝහල්වල පැවති ලක්ෂණ අනුව නිගමනය කළ හැකි ය. කෙසේ වෙතත් අනුරාධපුර යුගයේ වෛද්‍ය කටයුතු සාර්ථක ව පැවති බවත් ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය නොමඳ ව ලැබුණු බවත් අවසාන වශයෙන් නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද÷ වෛද්‍ය, අනුරාධපුර යුගය, සෞඛ්‍ය**

[1] සහකාර කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, manjuhis88@gmail.com